# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

08 කාණ්ඩය 03 කලාපය

2022 මාර්තු

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

ආධාරය රු 40.00


# ඇත්ත බලාපොරොත්තුවක් මහජන ව්‍යාපාරයක්
# මාර්තු 27 නුගේගොඩදී
# ජන අරගලයට සැරසෙමු!

**'ඇත්ත බලාපොරොත්තුවක්-මහජන ව්‍යාපාරයක්' යන්න තේමා පාඨය කර ගනිමින් ජන අරගල ව්‍යාපාරයේ ප්‍රථම සමුළුව, මාර්තු 27 වන දින සවස 3.00ට නුගේගොඩ ආනන්ද සමරකෝන් එළිමහන් රංග පීඨයේදී පවත්වන බව පෙරටුගාමී සමාජවාදී පක්ෂය පවසයි.**

ඩොලර් හිඟය, අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා හිඟය දිනෙන් දින ඉහළ යන බඩු මිල ඇතුළු සමස්ත ආර්ථික ආර්බුදය හමුවේ ආණ්ඩුවේ අභ්‍යන්තර දේශපාලන අර්බුදය පුපුරා යන්නට පටන්ගෙන තිබේ. මේ මොහොත කළමනාකරණය කර ගැනීම වෙනුවෙන් හදිසි බල මාරුවක් සඳහා විවිධ දේශපාලන පෙරමුණු ගොඩනැගෙමින් පැවතියද ඒවා පවතින ව්‍යුහාත්මක අර්බුදයට කිසිදු විකල්පයක් විසඳුමක් ඉදිරිපත් කර නැති බව අවධාරණය කරන පෙරටුගාමී සමාජවාදී, පක්ෂය එවැනි විකල්පයක් සඳහා පුළුල් සමාජ පරිවර්තනයක් වෙනුවෙන් ඇති එකම මග පළල් මහජන ව්‍යාපාරයක් ගොඩනැගීම බවද පවසයි. මාර්තු 27 නුගේගොඩදී මුළු දෙනු ලබන ජන අරගල ව්‍යාපාරයේ ප්‍රථම සමුළුව එවැනි පළල් මහජන ව්‍යාපාරයක සමාරම්භය සලකුණු කරනු ඇතැයි විශ්වාසය පළ කරන පෙරටුගාමී සමාජවාදී පක්ෂය එය කිසිසේත්ම මැතිවරණ පෙරමුණක් නොවන බවත් ජනතාවගේ දැවන ප්‍රශ්න හා ඉල්ලීම් මුල්කරගත් පන්ති බලවේගයන් එකට එක් කරන බහුජන සටන් මධ්‍යස්ථානයක් ලෙස එය ගොඩනගන බවත් පවසයි. එමගින් ජනතා න්‍යාය පත්‍රයක් මෙන්ම එය ජයග්‍රහණය කිරීම සඳහා වූ අව්‍යාජ බලය පාර්ලිමේන්තුවෙන් පිටත මහජන බලයක් ගොඩනැගීම වෙනුවෙන් කටයුතු කරයි. අවසානයේදී මෙලෙස ගොඩනැගෙන මහජන බලය සමාජ පරිවර්ථනයක් සඳහා උපයෝගීවනු ඇතැයිද විශ්වාසය පළ කරන 02 පිටුවට

# ගොවි ඉඩම් කොල්ලකන පනතක් පාර්ලිමේන්තුවට!

ඉඩම් සංවර්ධන සංශෝධන පනත් කෙටුම්පත නමින් 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනතට නව සංශෝධන ඉදිරිපත් කරමින් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. මෙම සංශෝධිත පනතින් ගොවීන් සතු කෘෂිකාර්මික ඉඩම් බහුජාතික සමාගම් අතට පත්කිරීම සහ ඒවා වෙළඳ භාණ්ඩ බවට පත් කිරීම වේගවත් වනු ඇතැයි ගොවි අරගල ව්‍යාපාරය පවසයි.

දැනට ලංකවේ සිටින සුළු ගොවීන්ගෙන් බොහොමයකට ඔවුන් වගා කරන කෘෂිකාර්මික ඉඩම්වල සින්නක්කර අයිතියක් නොමැති අතර ස්වර්ණ භූමි, ජය භූමි වැනි විවිධ නම්වලින් හඳුන්වන රජයේ ඉඩම්වල වගාකරන බලපත්‍රලාභීන්, මේ අතර එවැනි බලපත්‍රයක් පවා නොමැතිව රජයේ ඉඩම්වල වගාකරනු ලබන ගොවීන්ද විශාල ප්‍රමාණයක් සිටිති. මෙලෙස බලපත්‍රලාභින් ලෙස වගා කරනු ලබන ඉඩම් දැනට පවතින නීතය අනුව වාණිජ අරමුණුවලින් යුතුව විකුණා දැමිය නොහැකිය. මෙම පැරණි නීතිය ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් විවෘත වෙළඳපොළ තුළ වෙළඳ භාණ්ඩ බවට පත් කිරීමට බාදාවක් ලෙස සලකා ඒවා සංශෝධනය කරන ලෙස අධිරාජ්‍යවාදී සංවිධානවලින් විවිධ බලපෑම් එල්ල වෙමින් පවතියි. සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික ඉඩම්වල අයිතිය තහවුරු කිරීමට මුලා වී ඉදිරිපත් කර ඇති මෙම සංශෝධන 02 පිටුවට

# යුද්ධයේ පාර්ශ්වකරුවෙක් වෙන්න එපා!
## පෙ.ස.ප. පීඩිත බලවේගවලින් ඉල්ලයි

ලෝකු බලවතුන් අතර කෙරෙන යුද්ධයේ කිසිදු පාර්ශවයකට සහාය නොදක්වන ලෙස ලොව පුරා සිටින වැඩකරන ජනතාව ඇතුළු පීඩිත බලවේගවලින් ඉල්ලා සිටින බව පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව සහෝදරයා පවසයි.

යුද්ධය එපා, රුසියානු හමුදා යුක්රේනයෙන් පිටවෙනු නේටෝව විසුරුවාහරිනු, යුක්රේනය නේටෝව සමග කරන යුද ගනුදෙනුව වහා නතර කරනු යන සටන් පාඨය මුල්කර ගනිමින් කොළඹ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්යාලය ඉදිරිපිට පසුගියදා පැවැති උද්ඝෝෂණයේ අවසානයේ මාධ්‍ය වෙත අදහස් දක්වමින් දුමින්ද නාගමුව සහෝදරයා මේ බව පැවසීය. එම උද්ඝෝෂණය වාමාංශික පක්ෂ, වෘත්තීය සමිති ඒකාබද්ධ කර ගනිමින් පෙරටුගාමී සමාජවාජදී පක්ෂය සංවිධානය කර තිබුණි.

එහිදී තවදුරටත් අදහස් දක්වමින් එම යුද්ධයෙන් බැට කන්නේ 02 පිටුවට

# පැලැස්තර එපා PTA අහෝසි කරනු!

'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත' යනුවෙන් හඳුන්වමින් ත්‍රස්තවාදී පනතට සංශෝධන කිහිපයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. නමුත් මෙරට වාමාංශිකයන් මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සියලු දෙනාගේම ඉල්ලීම වූයේ ත්‍රස්තවාදය වැළක්වීමේ පනත මුළුමනින්ම අහෝසි කළ යුතු බවයි.

ආණ්ඩුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරය ඉලක්ක කර ගනිමින් සුළු සංශෝධන ප්‍රමාණයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇතත්, එම සංශෝධන මගින් පනතේ ප්‍රජාතන්ත්‍ර විරෝධී හා මර්දනකාරීභාවයේ කිසිදු අඩුවක් සිදු නොවේ.

# 51වැනි අප්‍රේල් සමරුව කළුතර නගර ශාලාවේදී

51 වැනි අප්‍රේල් විරු සමරුව අප්‍රේල් 5 දා සවස 3.00ට කළුතර නගර ශාලාවේ පැවැත්වීමට පෙරටුගාමී සමාජවාදී පක්ෂය කටයුතු කරමින් සිටියි.

සමාජවාදී සමාජ පරිවර්තනයක් වෙනුවෙන් ලංකාවේ සිදු කෙරුනු ප්‍රථම අවිගත් නැගිටීම ලෙස, බොහෝ දේශපාලන අඩුපාඩු මැද වුවද 71 අරගලය, ශ්‍රේෂ්ඨ පරාජයක් ලෙස හැඳින්විය හැකිය.




මාර්තු 8 ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් 'නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය' පැවැත්වූ විරෝධතාවයේ හා සම්මන්ත්‍රණයේ තේමාව වූයේ 'කාන්තා බලයක්-මහජන ව්‍යාපාරයක්' යන්නය. කාන්තාව ඇතුළු පීඩිතයන්ගේ ගැටලු විසඳීම අරමුණු කරගත් මහජන බලයක් සංවිධානය කිරීමේ අවශ්‍යතාව එහිදී අවධාරනය කෙරිණි. 12 පිටුවට